# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1656/10 - 2010 මැයි 31 වැනි සඳුදා - 2010.05.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**බතික් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ, 1979 අගෝස්තු මස 03 වැනි දින අංක 48 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස්වරයා වෙත පවරනු ලැබූ බලය අනුව ඉහත කී ආඥාපනතේ 33 (2) වැනි වගන්තිය යටතේ කම්කරු කොමසාරිස්වරයා විසින් බතික් කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයෙහි දැක්වෙන කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය පිළිබඳ තීරණය ගරු කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 33 (3) වගන්තිය සමග කියවෙන 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2010 ජුනි මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

මහින්ද මඩිහහේවා,
ලේකම්,
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය.

2010 මැයි මස 31 වැනි දින,
කොළඹ,
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

කම්කරු කොමසාරිස් විසින් බතික් කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන්ගේ කාල මිම්මේ වැඩ සඳහා වන අවම වේතනවලට අදාළව 1979.11.30 වැනි දින අංක 64/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තාවූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2008 ජුනි 30 වැනි දින අංක 1556/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද තීරණ එම උපලේඛනයට පහත දැක්වෙන කොටස් ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කරනු ලැබේ :–

බතික් කර්මාන්තයෙහි නියුක්ත I වැනි තීරයෙහි සඳහන් කම්කරුවන්ට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II වැනි තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන පරිදි විය යුතුය.

| *I වැනි තීරය* | *II වැනි තීරය වැඩ කරන දවසක් සඳහා වූ වේතන ප්‍රමාණය රු. ශ.* |
|---|---|
| (අ) චිත්‍ර ශිල්පී, මෝස්තරකරු | 420 00 |
| (ආ) තම්බන්නෝ, සායම් පොවන්නෝ | 360 00 |
| (ඇ) මදින්නෝ, පිටපත් ගන්නෝ, ඉටි කරන්නෝ | 330 00 |

*වැඩ කරන සාමාන්‍ය දවස*

වැඩ කරන සාමාන්‍ය දවස් (කෑම ගැනීම හෝ විවේකය සඳහා පැයක් ඇතුළුව ) වැඩ කරන සාමාන්‍ය දවසක් සමන්විත වන පැය ගණන පහත සඳහන් පරිදි විය යුතුය.

| | |
|---|---|
| (අ) සෙනසුරාදා හැර ඕනෑම දවසක | පැය 09 |
| (ආ) සෙනසුරාදා දවසක | පැය 06 |

06 - 307/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

**නිවේදනයයි**

**පෙර පාසල් සේවා කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33 (1) (අ) වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ 2000 පෙබරවාරි මස 21 වැනි දින අංක 1120/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබූ බලය අනුව ඉහත කී ආඥාපනතේ 33 (2) වගන්තිය යටතේ ඔහු විසින් පෙර පාසල් සේවා කර්මාන්තයේ නියුක්ත ගුරුවරුන් සහ සහායකයින් සම්බන්ධයෙන් පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන අවම වේතන ප්‍රමාණය පිළිබඳව කරන ලද තීරණය ගරු කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 33 (3) වන වගන්තිය සමග කියවෙන 29 (3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2010 ජුනි මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

මහින්ද මඩිහහේවා,
ලේකම්,
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය.

2010 මැයි මස, 31 වැනි දින,
කොළඹ,
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ දී ය.

***උපලේඛනය***

කම්කරු කොමසාරිස් විසින් පෙර පාසල් කර්මාන්තයෙහි නියුතු ගුරුවරුන් හා සහායකයින්ගේ කාල මිම්මේ වැඩ සඳහා වන අවම වේතනවලට අදාළව කරන ලද 2000 ජුනි මස 30 වැනි දින අංක 1138/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයෙහි වූ උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන

ලද්දා වූ ද, අවසන් වරට 2008 ජුනි මස 30 වැනි දින අංක 1556/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූ ද, තීරණ එම උපලේඛනයට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කරනු ලැබේ.

| I *වැනි තීරය* (*ප්‍රදේශය*) | II *වැනි තීරය* (*වෘත්තිය*) | III *වැනි තීරය* (*මාසික වේතනය*) *රු. ශ.* |
|---|---|---|
| මහ නගර සභා සීමාව තුළ | (*අ*) ගුරුවරුන් | 7,800 00 |
| | (*ආ*) සහායකයින් | 6,000 00 |
| නගර සභා සීමාව තුළ | (*අ*) ගුරුවරුන් | 6,990 00 |
| | (*ආ*) සහායකයින් | 5,580 00 |
| ප්‍රාදේශීය සභා සීමාව තුළ | (*අ*) ගුරුවරුන් | 5,640 00 |
| | (*ආ*) සහායකයින් | 4,590 00 |

ඉහත (ආ) සළකුණෙන් දැක්වෙන සේවාවන්ට මතු කී ඉහත (අ) සළකුණෙන් දැක්වෙන සේවාවලට සම්බන්ධ වූ හෝ ආනුෂාංගික වූ හෝ වෙනත් කිසියම් සේවාවක් වේ නම් ඒවා ද ඇතුළත් වේ.

06 - 307/2

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වැනි වගන්තිය යටතේ කම්කරු ඇමතිවරයා විසින් පනවනු ලැබ 1979 ඔක්තෝබර් මස 12 වැනි දින අංක 58 දරන රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබූ බලය අනුව, ඉහත කී ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ ඔහු විසින් වීදුරු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයෙහි දැක්වෙන කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය පිළිබඳව කරන තීරණය ගරු කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 33(3) වැනි වගන්තිය සමඟ කියවෙන 29 (3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2010 ජුනි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

මහින්ද මඩිහහේවා,
ලේකම්,
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය.

2010 මැයි මස 31 වැනි දින,
කොළඹ,
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ දී ය.

***උපලේඛනය***

කම්කරු කොමසාරිස් විසින් වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන්ගේ කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන වලට අදාළව කරන ලද 1980 ජුනි මස 26 වැනි දින අංක 94/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ විස්තරාත්මකව දක්වා ඇත්තාවූ ද කලින් කල වෙනස් කරන ලද්දාවූ ද අවසන් වරට 2008 ජුනි මස 30 වැනි දින අංක 1556/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ ද තීරණ එම උපලේඛනයට පහත කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කරනු ලැබේ.

වීදුරු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙහි නියුක්ත I වැනි තීරුවේ සඳහන් කම්කරුවන්හට කාල මීම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II වැනි තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන පරිදි විය යුතු ය.

| | *I වැනි තීරය* *සේවක පන්තිය* | *II වැනි තීරය* *වැඩ කරන දවස් සඳහා වූ වේතන ප්‍රමාණය* *රු. ශත* |
|---|---|---|
| (අ) | පිඹුම්කරු, යන්ත්‍රකරු | 408 00 |
| (ආ) | සහාය යන්ත්‍ර ක්‍රියාකරු, බුබුලුකරු, කැපුම්කරු, සහාය පිඹුම්කරු, උඳුන්කරු | 360 00 |
| (ඇ) | ගිනියම්කර මට්ටම් කරන්නා, හුලං ගහන්නා, බර ඇසුරුම්කරු, සහාය බුබුලුකරු | 342 00 |
| (ඈ) | කණිෂ්ඨ බුබුලුකරු, හැඩ සමකරන්නා, හරවන්නා, ගණන් කරන්නා | 330 00 |
| (ඉ) | කැපුම්කරු, විමිනි කැපුම්කරු, මට්ටම්කරු | 318 00 |
| (ඊ) | ඇසුරුම්කරු, ගෙනයන්නා | 300 00 |

**වැඩ කරන සාමාන්‍ය දවස**

සාමාන්‍ය දවසක් (කෑම ගැනීම, තේ විවේකය සඳහා පැයක් ඇතුළුව)

| | | |
|---|---|---|
| (අ) | සෙනසුරාදා හැර වෙන ඕනෑ ම දවසක් | පැය 9 |
| (ආ) | සෙනසුරාදා දවසක | පැය 6 |

06-307/3

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන තීරණ ගරු කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන ඇමතිවරයා විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29 (3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2010 ජූනි මස 01 වැනි දින සිට වලංගු විය යුතුය.

මහින්ද මඩිහහේවා,
ලේකම්,
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය.

2010 ක් වූ මැයි මස, 31 වැනි දින,
කොළඹ 05,
කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව 1993.07.07 වැනි දින අංක 774/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නිවේදනයේ සඳහන් උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2008.06.30 දින අංක 1556/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද තීරණ පහත දැක්වෙන කොටස් ආදේශ කරගෙන තවදුරටත් වෙනස් කරනු ලැබේ :–

*I වැනි කොටස*

සාමාන්‍ය වැඩ කරන දවසක් යන්නෙහි අර්ථ නිරූපනය (24 වන වගන්තිය)

1. ආහාරය හෝ විවේකය සඳහා පැයක් ඇතුළුව වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් වන්නා වූ පැය ගණන පහත සඳහන් පරිදි විය යුතුය.

සතියේ කිනම් හෝ දින 5 ක - පැය 09
සතියේ එක් දිනක (කෙටි වැඩ කරන දිනය) - පැය 06

*II වැනි කොටස*

සාමාන්‍ය වැඩ කරන සතිය (24 වන වගන්තිය)

2. සාමාන්‍ය වැඩ කරන සතියකට අයත් පැය ගණන 45 ට නොවැඩි විය යුතුයි.

*III වැනි කොටස*

සති නිවාඩුව (24 වගන්තිය)

සෑම සේව්‍යයකුම තමා යටතේ සේවය කරන සෑම සේවකයකුට ම කෙටි වැඩ කරන දිනට පසුව එළඹෙන එක් දිනක් සතියේ නිවාඩු දිනය වශයෙන් දිය යුතුවන්නේ ය. එසේ වුව ද පහත දැක්වෙන කොන්දේසි යටතේ සේව්‍යයාට, සේවකයා සති නිවාඩු දිනයේ දී වැඩෙහි යෙදවිය හැකි ය.

එදින කළ වැඩ සම්බන්ධයෙන් වැටුප් වශයෙන් සේවකයාට –

*(ඒ)* පළමුවන පැය 9 (ආහාර හෝ විවේකය සඳහා පැයක් ඇතුළුව) සඳහා, අවම දෛනික ප්‍රමාණය මෙන් 1 1/2 ක ප්‍රමාණයක් ගෙවිය යුතු වන අතර *;*

*(බී)* ඊට පසු වැඩ කළ සෑම පැයක් සඳහා ම, අවම දෛනික ප්‍රමාණය 8 න් බෙදා නිශ්චය කරගත් ප්‍රමාණය, මෙන් 1 1/2 ක ප්‍රමාණයන් අතිකාල වශයෙන්

ගෙවිය යුතු ය.

රජයේ නිවාඩු දවස් (25 වැනි වගන්තිය)

1. *(අ)* මෙකී ඡේදයේ සහ 2 වැනි ඡේදයේ විධිවිධානවලට යටත්ව සෑම සේවායෝජකයෙකු විසින් ම තමා යටතේ සේවයේ යොදවා සිටින සෑම සේවකයකුට ම 1971 අංක 29 දරන නිවාඩු පනතෙහි අර්ථානුකූල පහත දැක්වෙන එක් එක් රජයේ නිවාඩු දිනය වැටුප් සහිත නිවාඩු දිනයක් වශයෙන් ලබා දිය යුතු යඃ-

(1) දෙමළ තෛපොංගල් දිනය ;
(2) ජාතික දිනය (පෙබරවාරි 4) ;
(3) මීලා-දුන්-නබි (මොහොමඩ් නබි නායක තුමාගේ උපන් දිනය) ;
(4) සිංහල හා දෙමළ අළුත් අවුරුදු දිනය ;
(5) මැයි දිනය (මැයි 01) ;
(6) නත්තල් දිනය (දෙසැම්බර් 25).

2. ඉහත අනුඡේදයේ සඳහන් පරිදි යම් සේවකයකු රජයේ කවර නිවාඩු දවසක හෝ සේවයේ යෙදවීමට සේව්‍යයෙකුට පහත සඳහන් කොන්දේසි යටතේ හැකියාව ඇත :–

I. ඉහත නිවාඩු දිනයේ සේවයේ නියුක්ත කළ සේවකයාට ඒ වෙනුවෙන් අදාළ මාසයේ දිනකට ගෙවනු ලබන වැටුප මෙන් දෙගුණයකට සමාන වැටුපක් ගෙවීමට ; හෝ

II. එබඳු දවසක කළ වැඩ සඳහා ඒ වෙනුවට එම සේවකයාට එම මාසයේ ගෙවිය යුතු දිනක වැටුපට අමතරව එම වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින හෝ එදිනට පෙර යෙදෙන දිනයක වැටුප් සහිත නිවාඩුවක් දිය යුතු ය.

III. රජයේ නිවාඩු දිනයක වැඩ කරන විට අතිකාල ගෙවීම වන්නේ පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 25 වැනි වගන්තිය යටතේ පවිත්‍රතා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව මගින් රජයේ නිවාඩු දවස් ලෙස ප්‍රකාශ කළ දවසක සේවකයකු සාමාන්‍ය වැඩ කරන දවසක් සංයුක්ත වන අවම පැය ගණනට වැඩියෙන් වැඩ කළ සෑම පැයක් සම්බන්ධයෙන් ම, අවම අතිකාල ප්‍රමාණය විය යුත්තේ දිනක වැටුප 8 න් බෙදා නිශ්චය කරගත් පැයට ගෙවන ප්‍රමාණය මෙන් දෙගුණයකි.

06-307/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.